# බළන්ගොඩ නගර සභාව

## 2018-06-14 දින මහා සභා වාර්තාව

**ස්ථානය** - **බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය** - **2018-06-14**

**වේලාව** - **පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු ආරම්භ කෙරිණි. මෙදින පැවැත්වීමට යෙදී ඇති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට සහභාගීවීමේ අවශ්‍යතාවය පැහැදිලි කරමින් ගරු නාගරික මන්ත්‍රී** ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් ප.ව. 2.00 දක්වා සභාව අඩාලව කල් තැබීමට යෝජනා කරන ලදී.එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා විසින් මෙදින **ප.ව.2 .00 ට නැවත සභාවේ කටයුතු ආරම්භ කරන තෙක්** සභාව අඩාලව කල් තබන ලදී.

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ආර්. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

## 01. පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීම

පසුගිය සභාවේ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම්දුන් අවස්ථාවේ ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් විසින් සංශෝධනයන්ට යටත්ව 2018-05-28 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් එය ස්ථිර කරන ලදුව පසුගිය සභාවේ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.
මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රි ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා න්‍යාය පත්‍රය සකස් කිරීමේදි පසුගිය සභාවේ සමාලෝචනය හා ප්‍රගතිය න්‍යාය පත්‍රයට ඇතුළත් කල යුතු බව පෙන්වා දෙන ලදී.

ගරු නාගරික මන්ත්‍රි කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සභා වාර්තාවේ සංශෝධනයන් විය යුතු දෑ ලෙස පහත කරුණු ඉදිරිපත් කරන ලදී.

1. ගරු නාගරික මන්ත්‍රි කේ. ජී. ප්‍රේමදාස යන නම කේ. ජී. පේමදාස යනුවෙනුත්
2. 05:01:28 යටතේ මන්ත්‍රි දීමනාව රු. 3000.00 යන්න මන්ත්‍රි දුරකථන දීමනාව රු. 3000.00 යනුවෙනුත්
3. 05:05 ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් දැනට අනදමෙත්ගම පවත්වන පෙර පාසල යන්නෙහි විසින් යන වචනය ඉවත් යුතු බවත්
4. ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කිරීම සඳහා එවන ලද යෝජනා ඔවුන් විසින් ස්ථිර කිරීම වැරදි බවට තමා විසින් විරුද්ධතාවය ප්‍රකාශ කලද ඒ බව සභා වාර්තාවේ සටහන් වී නැති බව මෙහිදී පවසා සිටින ලද අතර
   එම කරුණු සංශෝධනයන් වශයෙන් මෙහිදී සභාගත කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රි ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා ඉහත ගරු නාගරික මන්ත්‍රි කේ. ජී. පේමදාස මැතිතුමා පැවසූ පරිදි සභාවේ සභිකයෙකු විසින් සභාවට ඉදිරිපත් කිරීම සඳහා එවන ලද යෝජනා ගරු සභාපතිතුමා සභාව වෙත ඉදිරිපත් කල අවස්ථාවක එම යෝජනා ඉදිරිපත් කල සභිකයාට එය ස්ථිර කිරීමේ හැකියාව පවතින බවට කරුණු පෙන්වා දෙන ලදී.

## 02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් නිවේදන ආරම්භ කරමින් සභාව මාසයකට වරක් රැස්වුවද එදිනට රු. 425,000.00 පමණ මුදලක් වැයවෙන බවත් එයින් ප්‍රතිපූර්ණය කළ හැක්කේ මන්ත්‍රී දීමනාව පමණක් බවත් ප්‍රකාශ කරන ලදි. කරුණු එසේ හෙයින් එම කාලය නිකරුණේ අපතේ

නොයවා, ප්‍රයෝජනවත් අයුරින් මහජනතාවගෙන් ලබා ගන්නා බදු මුදලට සරිලන සේ සභාවේ කාර්යය භාරය වගකීමෙන් ඉටුකිරීමට ක්‍රියාකරමුයි පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දක්වමින් කොට්ඨාශයට ලක්ෂ 10 වෙන් කිරීමේ සංවර්ධන වැඩසටහන යටතේ මන්ත්‍රී යෝජනා සඳහා වෙන් කරන ලක්ෂ 04 මුදල අඩුකල පසු ඉතිරි ලක්ෂ 6 මුදල අදාල කොට්ඨාශයේ ජනතාවගේ අවශ්‍යතා ප්‍රමුඛත්වය මත වැය කිරීමට අපේක්ෂා කරන බවත් තම කොට්ඨාශයේ එවන් අඩුපාඩු ඉටුවිය යුතු ස්ථාන තිබේ නම් පෙන්වා දෙන ලෙස ගරු සභිකයන් දැනුවත් කරන ලදී.

**03. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම**

මෙදින සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් වූයේ නැත.

**04. ප්‍රචාරක දැන්වීම් පුවරු මිල ගණන් විවෘත කිරීම සහ ගැනුම්කරුවෙකු තෝරා ගැනීම.**

ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ගැනුම්කරුවෙකු තෝරා ගැනීම පිණිස විවෘත ලංසුපත් කැඳවීමේදී ලද උපරිම ලංසු මුදල රු. 3716.00 වූ අතර අදාළ ගැනුම්කරු ටෙන්ඩරය ලබාගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. අනතුරුව ලැබී ඇති උපරිම ලංසු මුදල රු. 3531.00 ක් වූ අතර අදාළ ගැනුම්කරු ටෙන්ඩරය ලබාගැනීම ප්‍රතික්ෂේප කරන ලදී.ඉන්පසු තෙවනුව ලැබී තිබූ උපරිම ලංසු මුදල වූ රු. 3264.00 මුදලට ඒ. සුමිත් කුමාර යන ගැනුම්කරු තම එකඟත්වය ප්‍රකාශ කල බැවින් **ප්‍රචාරක දැන්වීම් පුවරු ටෙන්ඩරය** ඒ. සුමිත් කුමාර යන අය වෙත ලබාදෙන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා මෙම ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය වැරදි සහගත බවත්,මෙලෙස ටෙන්ඩර්කරු තෝරා ගැනීම පිළිබඳ තම විරුද්ධතාවය පල කරන බවත්, සභාව නොමග යැවීමට ඉඩ නොදී මීට වඩා නියම ක්‍රමවේදයකයට ටෙන්ඩර් කටයුතු සිදු කරන ලෙසත් පවසා සිටින ලදී. ගරු සභාපතිතුමා විසින් එම අදහස අනුමත කරමින් ඉදිරියේදී මෙම කටයුතු තවදුරටත් ක්‍රමවත් කල යුතු බව පවසා සිටින ලදී.

**05. කල් දී ඇති යෝජනා**

***05:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා***

**05:01:01 කසළ ටෙන්ඩරය දෙවන ටෙන්ඩර්කරුට ලබාදීම.**

කසල ටෙන්ඩරය දෙවන ටෙන්ඩර්කරුට ලබාදීම යෝජනාව සංශෝධනය කර කසළ ටෙන්ඩරය නැවත ටෙන්ඩර්කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී මේ පිළිබඳ පැහැදිලි කළ ගරු සභාපතිතුමා වර්තමාන ගැනුම්කරු ගිවිසුම් ප්‍රකාරව ක්‍රියා නොකිරීම හේතුවෙන් ඔහුගෙන් ටෙන්ඩරය ඉවත්කිරීමට තීරණය කල බවත්, 2018-05-29 දිනැතිව මහ සභා තීරණ අංක 05:01:11 යටතේ ගනු ලැබූ තීරණය පරිදි පළමු ටෙන්ඩර් කරු සහ දෙවන ටෙන්ඩර්කරු කැඳවා සාකච්ඡා කරන ලද අතර දෙවන ටෙන්ඩර්කරු පළමු

ටෙන්ඩර්කරුගේ මුදලට ටෙන්ඩරය ලබාගැනීම ප්‍රතික්ෂේප කළ අතර පළමු ටෙන්ඩර්කරුගේ මුදල වැඩිකිරීම පිළිබඳව විරෝධය ප්‍රකාශ කරන ලද බව පවසා සිටින ලදී.

වැඩි දුරටත් අදහස් දක්වමින් පසුගිය සති දෙකක කාලයක් තුළදී ද පළමු ටෙන්ඩර්කරුගේ රාජකාරිවල කිසිදු ප්‍රගතියක් දක්නට නොමැති වූ අතර මෙම කාර්යය නිසි පරිදි ඉටු නොවන බවට ගරු නාගරික මන්ත්‍රිනී චන්ද්‍රලතා මැතිතුමිය හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමාද පැමිණිලි කර ඇති බවත් මීට අමතරව මහජන පැමිණිලි ද ලැබී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. තත්ත්වය මෙසේ හෙයින් මෙයට අමතරව මොහුගේ සේවකයන්ට වැටුප් නොගෙවීම පිළිබඳව සේවකයන් විසින් මෙම සභාවට පැමිණ පැමිණිලි ඉදිරිපත් කර ඇති බවත් තත්ත්වය මෙසේ හෙයින් නැවත වරක් වසරක කාලයකට සරිලන පරිදි කසළ ටෙන්ඩරය සඳහා ටෙන්ඩර්පත් කැඳවීමට තීරණය කල බව ගරු සභාපතිතුමා විසින් පවසා සිටින ලදී.

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ස්ථිර කරගත් පරිදි කසළ ටෙන්ඩරය නැවත ටෙන්ඩර් කිරීම සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:02 සුසාන භූමි භාරකරුවන්ගේ දීමනාව රු. 10,000.00 දක්වා වැඩිකිරීම.**

සුසාන භූමි භාරකරුවන්ගේ දීමනාව ලෙස දැනට මොවුන් සඳහා රු. 7,000.00 ක දීමනාවක් ගෙවනු ලබන අතර මෙය වර්තමානයේ ප්‍රමාණවත් මුදලක් නොවන බැවින් මෙම මුදල රු. 10,000.00 දක්වා වැඩිකිරීම සඳහා ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී මෙම දීමනාව ගෙවීමට මත්තෙන් සෞඛ්‍ය පරිපාලකගේ අධීක්ෂණය යටතේ මුදල ගෙවීමට සුදුසු බවට නිර්දේශය ලබාගෙන ගෙවීම් සිදුකිරීම කරනලෙස ගරු සභාපතිතුමා විසින් පවසා සිටින ලදී. විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:03 සභාපති පුද්ගලික ලේකම් තනතුර සඳහා ඩබ්. ඒ. දිනේෂ් ප්‍රසාද් මහතා බඳවා ගැනීම.**

පා.පා.කොමසාරිස් චක්‍රලේඛ අංක CLG 1/1 සහ 2018.05.23 ප්‍රකාරව සභාපති පුද්ගලික ලේකම් තනතුර සඳහා ඩබ්. ඒ. දිනේෂ් ප්‍රසාද් මහතා බඳවා ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:04 දෙහිගස්තලාව 1 වන කණුව කුමාරගම මාර්ගය වී මෝළ ඉදිරිපිට සපත්තු කාණුව සම්බන්ධ කර මාර්ගයේ ආරක්ෂාව සඳහා පැති බැම්මක් ඉදිකිරීම.**

දෙහිගස්තලාව 1 වන කණුව කුමාරගම මාර්ගය වී මෝල ඉදිරිපිට සපත්තු කාණුව සම්බන්ධ කර මාර්ගයේ ආරක්ෂාව සඳහා පැති බැම්මක් ඉදිකිරීම සඳහා යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම පැති බැම්ම ඉදිකිරීමේ අත්‍යවශ්‍යතාවය පිළිබඳ කරුණු පැහැදිලි කරමින් ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් සභාවේ ඒකමතිකව සම්මත විය.

**05෴01෴05 අක්කර 18 මාර්ගයේ ආරම්භක ස්ථානය සඳහා පැති බැම්මක් ඉදිකිරීම**

අක්කර 18 මාර්ගයේ ආරම්භක ස්ථානය සඳහා පැති බැම්මක් ඉදිකිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මෙහිදී අදහස් දක්වූ එතුමා මෙහි ආරම්භක ස්ථානයේ ඇති බෝක්කුව කැඩී ගොස් ඇති බැවින් කඩිනමින් මෙය සිදුකිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පෙන්වා දෙන ලදී.විරෝධතා නොමැති හෙයින් මෙම යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05෴01෴06 මාළු කඩ සඳහා අළුතින් මඩු සකස් කර පොදු වෙළෙඳ සැල පිටුපසට ගෙනයාම.**

මාළු කඩ සඳහා අළුතින් මඩු සකස් කර පොදු වෙළෙඳ සැල පිටුපසට ගෙනයාම සුදුසු බවට ගරු සභාපතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් මාළු කඩ අළුතින් සෑදීමට බලාපොරොත්තු වන්නේ කුමන ස්ථානයේද යන්න ඇසූ පැනයට ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්, පොදු වෙළෙඳ සැල පිටුපස ඇති වැසිකිළි කඩා ඉවත් කළ පසු මාළු අලෙවි කිරීම සඳහා සුදුසු ආකාරයට එම ස්ථානයේ තාවකාලික මඩු ගසා සුදානම් කරදීමට අපේක්ෂා කරන බවත්, ඉදිරි සභාවකදී මේ පිළිබඳ තොරතුරු වැඩි දුරටත් විස්තරාත්මකව ඉදිරිපත් කරන බවත් පවසා සිටින ලදී. එහිදී විරෝධතා නොමැති හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05෴01෴07 2018 වසර සඳහා තුඹගොඩ සාංඝිකාරාමය විසින් මෙහෙයවනු ලබන මිහිඳු පෙරහැර සඳහා රු. 25,000.00 ක මුදල් ආධාරයක් ලබාදීම.**

2018 වසර සඳහා තුඹගොඩ සාංඝිකාරාමය විසින් මෙහෙයවනු ලබන මිහිඳු පෙරහැර සඳහා රු. 25,000.00 ක මුදල් ආධාරයක් ලබාදීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගෙනෙන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05း01း08 පදික කඩ ලබාදෙන්නන්ගෙන් එක් අයෙකුගේ පෙරගෙවුම් මුදල් ලෙස රු. 140,000.00 ක මුදලක් ලබාගැනීම.**

පදික කඩ ලබාදෙන්නන්ගෙන් එක් අයෙකුගේ පෙරගෙවුම් මුදල් ලෙස රු. 140,000.00 ක මුදලක් ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී මේ පිළිබඳ කරුණු දැක්වූ ගරු සභාපතිතුමා එක් කඩ කාමරයක් ඉදිකිරීම සඳහා රු. 130,000.00 ක පමණ මුදලක් වැයවන බැවින් සමස්ථ ඇස්තමේන්තුව රු. 3,488,000.00 පමණ වන බවත් සභාවට එවැනි වියදමක් මෙම අවස්ථාවේදි දැරිය නොහැකි නිසා හා සියළුම පදික වෙළදුන් මෙම මුදල සෙවීමට එකඟතාවය පලකර ඇති නිසා මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව පවසා සිටින ලදී. විරෝධතා නොමැති හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05း01း09 සභාපතිතුමාගේ PF 4006 නිල රථය සඳහා මාසික ඉන්ධන සීමාව ලීටර් 500 ලෙස අනුමත කිරීම.**

සභාපතිතුමාගේ PF 4006 නිල රථය සඳහා මාසික ඉන්ධන සීමාව ලීටර් 500 ලෙස අනුමත කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05း01း10 දැන්වීම් පුවරු අතුරු ව්‍යවස්ථාව සඳහා අනුමැතිය ලබා ගැනීම.**

බලංගොඩ නාගරික බල ප්‍රදේශය තුල දැන්වීම් ප්‍රදර්ශනය කිරීම විධිමත් කිරීම,පාලනය කිරීම, පරිපාලනය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා සකස් කරන ලද අතුරු ව්‍යවස්ථාව සභාවට ඉදිරිපත් කරමින් ඒ සභාවේ අනුමැතිය පතමින් ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05း01း11 පින්තාලිය ඉදිකිරීම - තුරු උයන**

මොහාන් සාළිය එල්ලාවල මාවතේ තුරු උයන ඉදිරිපස ඇති ස්වභාවික දිය දහර උපයෝගි කරගෙන පින්තාලියක් ඉදිකිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රි ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා මෙම යෝජනාව යහපත් අදහසක් බවත්, වතුර ඉවතට ගලායන ප්‍රමාණය ප්‍රයෝජනයට ගෙන පින්තාලිය ඉදිකිරීමේ කටයුතු සිදුකිරීම වඩාත් සුදුසු බවත් පවසා සිටින ලදී.

මෙහිදී තව දුරටත් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, තුරු උයන අභාවයට යමින් පවතින බවත් නිසි නඩත්තු කටයුතු සිදුකර පෙර පැවති තත්වයට ගැනීමට කඩිනමින් සංවර්ධන කටයුතු කලයුතු බවත් පෙන්වා දෙන ලදී. විරෝධතා නොමැති හෙයින් ඉහතින් කරන පින්තාලිය ඉදිකිරීමේ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:12 බස් නැවතුම්පොළ ඉදිරිපස පිහිටි අංක 185/21 දරණ කඩකාමරයේ බදු අයිතිය වෙනස් කිරීම.**

බස් නැවතුම්පොළ ඉදිරිපස පිහිටි අංක 185/21 දරණ කඩකාමරයේ බදු අයිතිය වෙනස් කිරීමටත්, මෙලෙස බදු අයිතිය වෙනස් කිරීමේදි රු.50,000.00 මුදලක් හැරවුම් මුදලක් ලෙස සභාවට අයකර ගැනීමත් සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:13 බස් නැවතුම්පොළ කාර්පාක් හා සාප්පු කඩ කාමර කුලී තක්සේරුව ක්‍රියාත්මක කිරීම**

පළාත් පාලන කොමසාරිස් කාර්යාලය විසින් දන්වා එවා ඇති පරිදි තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේ තක්සේරු කර එවා ඇති සියළුම කඩ කාමරවල නව තක්සේරු මුදල 2018 ජූනි මස සිට ක්‍රියාත්මක කිරීමට සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් ඉහතින් දක්වූ කඩකාමර සඳහා හිග කුලී අයකර ගැනීමක් සිදුවේද යන්නෙන් ඇසූ ප්‍රශ්නයට පිළිතුරු සැපයූ ගරු සභාපතිතුමා, 2015 වර්ෂයේ සිට මෙම තක්සේරුව ක්‍රියාත්මක කෙරුණි නම් හිග මුදලක් අයකර ගැනීමට සිදුවෙන නමුත් මෙම තක්සේරුව 2018 ජූනි මස සිට ක්‍රියාත්මක කිරීමට ගත් තීරණය නිසා හිග මුදලක් ඇති නොවන බැවින් අයකර ගැනීමක් සිදු නොවන බවත් ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් මෙලෙස හිග මුදල් අයකර නොගැනීම හා තක්සේරුව 2018 ජූනි සිට ක්‍රියාත්මක කිරීමෙන් සභාවට අධිභාරයක් දැරීමට සිදුවේද යන්න ඇසූ පැනයට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා ඉහත යෝජනාවේදි එසේ අධිභාරයක් ගෙවීමට සිදු නොවන බව ප්‍රකාශ කර සිටින ලදී.

ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් මේ පිළිබඳ කරුණු පැහැදිලි කර දෙමින් හිග මුදලක් අයකර ගැනීමක් සිදු නොවන බවත් පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති තීරණය අනුව මෙම තක්සේරුව 2018 ජූනි සිට ක්‍රියාත්මක කිරීමට ගත් කඩිනම් තීන්දුව ඉතා යහපත් බවත් ගරු සභාවට පෙන්වා දෙන ලදී. මෙහිදී විරෝධතා නොමැති හෙයින් බස්

නැවතුම්පොළ කාර්පාක් හා සාප්පු කඩ කාමර කුලී තක්සේරුව 2018 ජූනි සිට ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය

**05:01:14 කඩකාමර ගිවිසුමේ කෙටුම්පත සභාගත කිරීම.**

කඩකාමර ගිවිසුමේ කෙටුම්පත සභාගත කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් අදහස් දක්වමින් මෙම කඩවල ගිවිසුම් සකස් කිරීම සඳහා සභාවේ නාගරික මන්ත්‍රීවරියක් වන නීතීඥ එම්. ශාන්තිලේඛා මැතිතුමිය වෙත ලබාදීම සුදුසු බවත් එතුමිය සභාව වෙත සහනයක් වෙන පරිදි එම කටයුතු සිදුකරනු ඇතැයි පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දක්වනු ලැබූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා මෙලෙස වසරින් වසර ගිවිසුම් අත්සන් කිරීම නිසා වියදම වැඩිවෙන බැවින් සභාවේ ධූර කාලයට සරිලන පරිදි එකවර ගිවිසුම් අත්සන් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එහෙයින් කඩකාමර ගිවිසුමේ කෙටුම්පත සභාගත කිරීමේ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. ඇස්තමේන්තු අනුමත කරගැනීම

06:01 2018 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා විසින් ඉදිරිපත්කරන ලද වැවවත්ත නිවාස සංකීර්ණයෙ වැසිජල කානුව සඳහා වැයවන ඇස්තමේන්තුගත මුදල රු. 400,000.00 සභාවට ඉදිරිපත් කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

06:02 2018 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද කිරිමණ්ඩලය අසළ කොන්ක්‍රිට් කිරීම රු. 180,000.00 හා ෆලීල් හාජියාර් මාවත වතුර ටැංකිය අසල කොන්ක්‍රිට් කිරීම රු. 9,000.00 හා මිරිස්වත්ත විලියම් මාවත කොන්ක්‍රීට් කිරීම රු. 270,000.00 වන ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

06:03 2018 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද බලංගොඩ ජාතික පාසල් රවුම් පාර කොන්ක්‍රීට් කිරීම සඳහා වැය වන රු. 400,000.00 වන ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

06:04 බළන්ගොඩ නගර සභා කාර්යාල ගොඩනැගිල්ලට අලුතින් කොටසක් එක් කිරීම සඳහා වූ ගරු සභාපති චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද රු. 2,594,858.38 ක ඇස්තමේන්තුව සහා අරමුදලෙන් ඉටුකර ගැනීම සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. මන්ත්‍රී යෝජනා

### *07:01 ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා*

07:01:01 බලංගොඩ කල්තොට මාර්ගයේ සි/ස මිල්ක්ෆුඩ් ආයතනය ඉදිරිපිටින් වැටී ඇති දුණුමඩලගහවත්ත මාර්ගය සඳහා කාණු පද්ධතිය සකස් කිරීම.

ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

07:01:02 බලංගොඩ කල්තොට මාර්ගයේ 01 කණුව අසලින් ජස්ටින් ප්‍රනාන්දු මහතාගේ නිවස අසලින් දකුණු පසට විහිදී ඇති බෙත්තාරාම විහාරස්ථාන මාර්ගය ශ්‍රී සංඝබෝධි නා හිමි මාවත නමින් නම් කර ලියාපදිංචි කිරීම.

ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

07:01:03 ඉහත අංක 02 යටතේ සඳහන් කර ඇති මාර්ගය බෙත්තාරාම විහාරස්ථානය අසළ සිට ආර්ථික සංවර්ධන නිලධාරී කාර්යාලය දක්වා ඇති කොටස ඉතා අබලන් තත්ත්වයක පවතින නිසා එම කොටස ප්‍රතිසංස්කරණය කිරීම.

ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

07:01:04 බළන්ගොඩ බදුලු ප්‍රධාන මාර්ගයේ ඇල්පා තේ කර්මාන්ත ශාලාව අසල සිට පුංචි පාලම දක්වා පාර දෙපස පදිංචි නිවැසියන් සඳහා පානීය ජලය ලබාදීම.

ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

07:01:05 බළන්ගොඩ නගර සභා පරිපාලන ප්‍රදේශය තුළ සැරිසරන අයාලේ යන සුනඛයින් හා ගවයින් සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීම.

ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා තම යෝජනා සම්බන්ධයෙන් අදහස් දක්වමින් බලංගොඩ කල්තොට මාර්ගයේ සි/ස මිල්ක්ෆුඩ් ආයතනය ඉදිරිපිටින් වැටී ඇති දුණුමඩලගහවත්ත මාර්ගය සඳහා කාණු පද්ධතිය සකස් කර, මඩ රැදුන ස්ථාන පිලිසකර කර,කොන්ක්‍රිට් ස්ලැබ් දැමීම සිදුකර දෙන ලෙසත්, බලංගොඩ කල්තොට මාර්ගයේ 01 කණුව අසලින් ජස්ටින් ප්‍රනාන්දු මහතාගේ නිවස අසලින් දකුණු පසට විහිදී ඇති බෙත්තාරාම විහාරස්ථාන මාර්ගය,කලින් අඩිපාරක්ව පැවති සමයේ එම මාර්ගය වර්තමාන තත්වයට ගෙන ඒම සඳහා මහත් සේවාවක් ඉටුකරන ලද එම විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේට පුදන ගෞරවයක් වශයෙන් ශ්‍රී සංඝබෝධි නා හිමි මාවත නමින් නම් කර ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසත්, එම මාර්ගයේ බෙත්තාරාම විහාරස්ථානය අසළ සිට ආර්ථික සංවර්ධන නිලධාරී කාර්යාලය දක්වා ඇති කොටස ඉතා අබලන් තත්ත්වයක පවතින නිසා එම කොටස කඩිනමින් ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිතුමා බළන්ගොඩ බදුලු ප්‍රධාන මාර්ගයේ ඇල්පා තේ කර්මාන්ත ශාලාව අසල සිට පුංචි පාලම දක්වා පාර දෙපස පදිංචි නිවාස 11කට පමණ පානීය ජල ගැටළුවක් පවතින බවත් ඒ සඳහා අවධානය යොමු කරන ලෙසත් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.එමෙන්ම බළන්ගොඩ නගර සභා පරිපාලන ප්‍රදේශය තුළ සැරිසරන අයාලේ යන සුනඛයින් හා ගවයින් සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ගයක් ගත යුතු බවත් මෙම සුනඛයින් බොහෝමයකට ස්කැබීස් රෝගය වැළදී ඇති අතර එය මිනිසුන්ටද බෝවන බවත් වහාම මෙම සතුන් නිසා සාමාන්‍ය ජන ජීවිතයට වෙන හානිය වැළැක්වීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු බවත් පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා නාගරික සීමාව තුල මෙම සුනඛයින් විශාල ලෙස බෝ වීම සාමාන්‍ය ජන ජීවිතයට මහත් ගැටළුවක් වී ඇති බවත් මෙම සුනඛයින් වන්ධ්‍යාකරණයට ක්‍රමවේදයක් අනුගමනය කල යුතු බවත් පවසා සිටින ලදී. මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා පශු වෛද්‍ය නිළධාරි හා සෞඛ්‍යය වෛද්‍ය නිළධාරි කාර්යාලය දැනුවත් කර සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට ඉදිරියේදි කටයුතු කරන බවට පවසා සිටින ලදී.

***07:02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා***

07:02:01 නගර සභා පෙර පාසල් පාලිකාවන්ගේ දීමනාව රු. 10,000.00 සිට රු. 15,000.00ක් දක්වා වැඩිකිරීම.

07፡02፡02 රාස්සගල පාරේ විදුලබල මණ්ඩලය අසළ ලී මඩුව පාර,දෙමළ විද්‍යාල මාවත, දෙණියකුඹුර නීලිකා මහත්මියගේ නිවස පාර, වැවවත්ත උද්‍යාන මාර්ග සහ බුළත්ගම විද්‍යාලය පිවිසුම් මාර්ගයේ නඩත්තු කටයුතු සිදුකිරීම.

07፡02፡03 2018 අයවැය ලේඛනය සඳහන් පරිදි එක් එක් කොට්ඨාශ සඳහා වෙන්කර ඇති රු. 1,000,000.00 ප්‍රතිපාදනය අදාළ කොට්ඨාශයෙන් තේරි පත් වූ මන්ත්‍රිවරුන්ට ලබාදීම.

07፡02፡04 බළන්ගොඩ නගර සභාවේ හිටපු නාගරික මන්ත්‍රී දිවංගත පූජ්‍යදාස තේනුවර මැතිතුමාට කරන ගෞරවයක් වශයෙන් එතුමාගේ නමට නගරයේ වීථියක් හෝ මාර්ගයක් නම් කිරීම

07፡02፡05 බුලත්ගම සිරි සුනන්දාරාම මාවතට පානීය ජලය ලබාදීම

07፡02፡06 දෙණියකුඹුර සුමිත් දයානන්ද මහතාගේ නිවස පාරේ ඉතිරි කොටස පැති බැම්ම සාදා පාර කොන්ක්‍රීට් කිරීම

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමන් විසින් ඉහතින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි වසන්ත ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මුලින් ඉදිරිපත් කර ඇති යෝජනා තුන පිලිබඳ පසුගිය සභා වාරයේදි කරුණු ඉදිරිපත් කල බවත්, යෝජනා ස්ථිරත්වයේ ගැටළුවක් බැවින් නැවත මෙම සභාවට ඉදිරිපත් කල බැවින් නැවත ඒ පිළිබඳ කථා කිරීමට අදහස් නොකරන බවත්' මෙහිදී ගරු නාගරික මන්ත්‍රි ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා විසින් පවසා සිටින ලදී.

වැඩිදුරටත් අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාවේ හිටපු නාගරික මන්ත්‍රී දිවංගත පූජ්‍යදාස තේනුවර මැතිතුමාට කරන ගෞරවයක් වශයෙන් හා එතුමා නගරයට සිදුකල සේවය වෙනුවෙන් එතුමාගේ නමට නගරයේ වීථියක් හෝ මාර්ගයක් නම් කිරීම අගනා මෙහෙවරක් බවත් ඊට තානායම් පිවිසුම් මාර්ගය හෝ පොදු වෙළෙඳ සැල් මාර්ගය සුදුසු බවත් යෝජනා කරන ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා ඒ සඳහා සුදුසු මාර්ගයක් තීරණය කර සභාවට දන්වන ලෙස පවසා සිටින ලදුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.

තව දුරටත් අදහස් දක්වමින් බුලත්ගම සිරි සුනන්දාරාම මාවතට පානීය ජලය ලබාදීම පිළිබඳ යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කල ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා ඉන් පන්සලට ,දහම්පාසලට, පන්සල අසල සිටින නිවැසියන්ට සිදුවන සේවය පිළිබඳ ගරු සභාවට පෙන්වා දෙන ලදී. මෙයට පිළිතුරු ලබාදෙමින් ගරු සභාපතිතුමා විසින් ජල සම්පාදන මණ්ඩලය සමඟ සාකච්ඡා කොට මෙම කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර ගැනීමට බලාපොරොත්තු වන බව පවසා සිටින ලදුව එම තීරණය සභාවේ ඒකමතිකව සම්මත විය.

එමෙන්ම දෙණියකුඹුර සුමිත් දයානන්ද මහතාගේ නිවස පාරේ ඉතිරි කොටස පැති බැම්ම සාදා පාර කොන්ක්‍රීට් කිරීම පිළිබඳ ගරු සභාවේ අවධානය යොමුකරන ලෙසද ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමන් විසින් මෙහිදී ඉල්ලා සිටින ලදී.මේ සඳහා ඉදිරියේදි කටයුතු කිරීම සඳහා ගත් තීරණය සභාවේ ඒකමතිකව සම්මත විය.

*07:03 ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා*

07:03:01 මිරිස්වත්ත කහටපිටිය මාර්ගය ආරම්භ කොටස අබලන් වී ඇති හෙයින් එය ප්‍රතිසංස්කරණය කිරීම

මිරිස්වත්ත කහටපිටිය මාර්ගය ආරම්භ කොටස අබලන් වී ඇති හෙයින් එය ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය විසින් එය ස්ථිර කරන ලදී.

මේ පිළිබඳ අදහස් දැක්වූ ගරු උප සභාපතිතුමා මෙම මිරිස්වත්ත කහටපිටිය ආරම්භ කොටස කාපට් මාර්ගයක් ලෙස ආරම්භ වුවද ඉන් ඔබ්බට වතුර වළවල් සෑදී සාමාන්‍ය ජනතාවට, පාසල් ළමුන්ට යා නොහැකි තත්වයට පත් වී විනාශ වී ඇති හෙයින් ජේ.සී.බී. යන්ත්‍රය යොදවා එම ස්ථානයේ කාණුවක් කපන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.
මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා මෙය සභාවට අයිති පාරක් නොවන බැවින් හා මාර්ග සංවර්ධන අධිකාරියේ පාරක් බැවින් සංවර්ධන කටයුතු ඉටුකල නොහැකි බවත් පසුගිය වකවානුවල එවැනි කටයුතු සිදු කිරීමට ගොස් කරදරවලට මුහුණ දීමට සිදු වූ අවස්ථා වූ බවට පෙන්වා දුන් අතර තම පෞද්ගලික මුදල්ද මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු සඳහා යොදවා ඇති බවත් තමා විසින් මේ වන විට සාකච්ඡා කර ඇති පරිදි ගරු අමාත්‍ය කරුණාරත්න පරණවිතාන මැතිතුමා මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු සඳහා ඉදිරියේදි ලක්ෂ 20 ක මුදල් ප්‍රතිපාදන ලබාදෙන බවට ප්‍රකාශ කර ඇති බවත් පවසා සිටින ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම මාර්ගය මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයක් බැවින් මෙය සිදු කිරීමට නීතිමය තත්වයක් නොමැති බවත් පළාත් සභාවෙන් විරුද්ධ වෙන බවත් පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා මෙම මාර්ගය පිළිබඳව එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා දක්වා ඇති අවධානය පිළිබඳ විශේෂයෙන් ස්තුතිවන්ත වන බවද ඉදිරියේදි ලැබීමට නියමිත ලක්ෂ 20 ප්‍රතිපාදනය පිළිබඳ මහත් සේ සතුටු වන බවද කවුරුන් කෙසේ අදහස් ප්‍රකාශ කලද පීඩාවට පත් වී තිබෙන එම මාර්ගයේ ගමන් කරන සභාවට වරිපනම් ගෙවන සාමාන්‍ය ජනතාවගේ වර්තමාන දුෂ්කරතාවය පිළිබඳ සලකා ජේ.සී.බී. යන්ත්‍රය යොදා එම ස්ථානයේ කාණුව සකස් කර

දෙන ලෙසත්, ගැටළුවක් සිදු වුවහොත් තම පුද්ගලික මුදලින් එම වියදම දැරීමට සූදානම් බවත්,පළාත් සභාවෙන් අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට තමා සූදානම් බවත් ඒ සඳහා ලිපියක් සකස්කර දෙන මෙන් අදාළ නිළධාරින්ගෙන් ඉල්ලා සිටින බවත් මෙහිදී පවසා සිටින ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් මෙහි ඇති නීතිමය තත්වය පිළිබඳ කරුණු විමසා බලා ඉදිරියේදි කටයුතු කිරීම සඳහා ගත් තීරණය සභාවේ ඒකමතිකව සම්මත විය.

### *07:04 ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා*

07:04:01 තම බල ප්‍රදේශයේ අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස අලුත්වැඩියාව සඳහා අලුත්වැඩියා ද්‍රව්‍ය හා වැසිකිළි පහසුකම් නොමැති අය සඳහා ද්‍රව්‍යමය ආධාර ලබාදීම

07:04:02 බෝම්බුව නිල්වලා හා වතුකාරගොඩ ක්‍රීඩා සමාජ පිට්ටනි සඳහා විදුලි බලය ලබාදීම

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා දෙක ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා තම බල ප්‍රදේශයේ අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස අලුත්වැඩියාව සඳහා අලුත්වැඩියා ද්‍රව්‍ය හා වැසිකිළි පහසුකම් නොමැති අය සඳහා ද්‍රව්‍යමය ආධාර ලබාදීම පිළිබඳ ගරු සභාවේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටි අතර බෝම්බුව නිල්වලා හා වතුකාරගොඩ ක්‍රීඩා සමාජ පිට්ටනි සඳහා විදුලි බලය ලබාදීම පිණිස සභාවේ විශේෂ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

මෙහිදී තව දුරටත් අදහස් ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමන් විසින් වර්තමානයේ තරුණ පිරිස් නීති විරෝධී, සමාජ විරෝධි ක්‍රියා සඳහා පෙළඹී සිටින අවස්ථාවක මෙසේ ක්‍රීඩාවට යොමු වීම අගය කල යුත්තක් බවත්,දහවල් කාලයේ රැකියා කටයුතුවල නිරත වෙන තරුණ පිරිස් සඳහා රාත්‍රි කාලයේ ක්‍රීඩා කිරීමට වීථි ලාම්පු ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. එමෙන්ම විදුලි බිල ගෙවීමට ඔවුන් කැමති බවද ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී විදුලිය ලබාගත යුත්තේ සමිතියේ නමටද,සභාවේ නමටද යන්න පිලිබඳ නීතිමය තත්වය විමසා බලා ඉදිරියේදි ඒ පිළිබඳ කටයුතු සිදුකරන බව ගරු සභාපතිතුමා විසින් පවසා සිටින ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

### *07:05 ගරු නාගරික මන්ත්‍රිනී එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය*

07:05:01 බළන්ගොඩ උඩ ඇල්ලෙපොල සරස්වතී පාර කෙළවර පිහිටි කනත්ත පාර සිට උඩ ඇල්ලෙපොල මහමෙව්නා පාර සම්බන්ධ කෙරෙන පාර පිළිසකර කර සංවර්ධනය කිරීම

ගරු නාගරික මන්ත්‍රිනී එම්. පී. ශාන්තිලේඛා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රිනි එම්. පී. ශාන්තිලේඛා මැතිතුමිය බළන්ගොඩ උඩ ඇල්ලෙපොල සරස්වතී පාර කෙළවර පිහිටි කනත්ත පාර සිට උඩ ඇල්ලෙපොල මහමෙව්නා පාර සම්බන්ධ කෙරෙන පාර පිළිසකර කර සංවර්ධනය කිරීම සිදුකර දෙන ලෙසත්, එම ගම් වැසියන්ගේ යෝජනාවක් අනුව ගම් දෙක යා කෙරෙන මෙම ස්ථානය පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී. මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා ජේ.සී.බී. යන්ත්‍රය යොදා ඉදිරියේදි එම ස්ථානය පිලිසකර කිරීමට අපේක්ෂා කරන බව පවසා සිටින ලදුව විරෝධතා නොමැති හෙයින් සභාවේ ඒකමතිකව සම්මත විය.

***07:06 ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමා***

07:06:01 ඕලුගංතොට සුසාන භූමි ශාලාව තීන්ත ගෑම සඳහා ප්‍රතිපාදන ලබාදීම.

ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමන් මෙම සුසාන භූමි ශාලාවේ අවුරුදු දහයකින් පමණ තීන්ත ගා නොමැති බවත් එය සිදුකර දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

07:06:02 බුද්ධ ජයන්ති පාරේ තැනින් තැන හෑරී ඇති වලවල් වලට පිළියම් යොදා කාණු පද්ධතියේ කොන්ක්‍රීට් ලෑලි නොමැති ස්ථාන වලට කොන්ක්‍රීට් ලෑලි යොදා සකස් කිරීම.
ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා මෙම මාර්ගයේ තැනින් තැන හෑරී ඇති වලවල් වලට ප්‍රිමික්ස් යොදා අඩු පිරිවැයකින් සිදුකල හැකි බැවින් එය සිදුකර දෙන ලෙසත්, කාණු පද්ධතියේ කොන්ක්‍රීට් ලෑලි නොමැති ස්ථානවලින් පාසල් ළමුන් වැටී ඇති අවස්ථා අසන්නට ලැබී ඇති බවත් එම ස්ථාන කොන්ක්‍රීට් ලෑලි යොදා සකස් කර දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

07:06:03 ඕලුගංතොට සෙලෝවත්ත මාර්ගයේ කාණු පද්ධතිය ජේසීබී යන්ත්‍රය යොදා අඩි 02 ක් වන සේ හාරා සකසා දීම

07:06:04 ගමගෙදර මාර්ගය කාණු පද්ධතිය සකසා දීම

ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද 07:06:03 සහ 07:06:04 ඉහත යෝජනා දෙක ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. මෙහිදී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රි රවින්ද්‍ර කවිරත්න මැතිතුමා මෙම කාණු පද්ධතීන් දෙකේ පවතින අඩුපාඩු නිසා අදාළ ගම්වාසීන් මුහුණදෙන දුෂ්කරතා පැහැදිලි කරමින් කඩිනමින් එය පිළිසකර කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

07:06:05 ඇල්ලෙඅරාව ගමේ ජීවත් වෙන ජනතාවගේ පානීය ජල ගැටලුවට පිළියම් ලෙස සරසි හෝටලය පිටුපස ඇති ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම.

07:06:06 රයිවත්ත මාර්ගයේ බැම්ම සකසා දීම.

ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා දෙක ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. මෙහිදී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රි රවින්ද්‍ර කවිරත්න මැතිතුමා සරසි හෝටලය පිටුපස ඇති ළිඳ ප්‍රතිසංස්කරණය කිරීමෙන් එම ඇල්ලෙඅරාව ගමේ ජීවත් වෙන ජනතාවගේ පානීය ජල ගැටලුවට යම්තාක් දුරකට පිළියම් යෙදිය හැකි බවත් රයිවත්ත මාර්ගයේ බැම්ම සකසා දීම ඉතා අත්‍යවශ්‍ය කටයුත්තක් බවත් එහි මාර්ගය පටන් ගන්නා ස්ථානය ඉවුර නාය යාම හා රයිවත්ත ගමට යන ජනතාව හා පරණ සුසාන භූමි ඉඩමේ පදිංචි වී සිටින නගර සභා ගම්වාසීන් කිහිප දෙනෙක්ද මෙම මාර්ගය භාවිත කරන බැවින් මෙම මාර්ගයේ බැම්ම සකසා දීම පිලිබඳවද සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී.

07:06:07 කරදියමුල්ල පාරේ ගමගෙදරට හැරෙන පාර අසල නිවාස වලට අනතුරු දායක ලෙස ඇති කොට්ට ගස කපා ඉවත් කිරීම

ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මෙහිදී අදහස් ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා මෙම ගස හේතුවෙන් අවට නිවාස වලට අනතුරු දායක තත්වයක් ඇති බැවින් ගස කපා ඉවත්කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

07:06:08 ඕලුගංතොට සිට බලන්ගොඩ පැත්තට එන මගින්ට බස් නැවතුම්පොළක් සෑදීමට ඉඩ කඩ වෙන්කර බස්නැවතුම්පල සාදා නිම කිරීම.

ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර රෝහල සඳහා පැමිණෙන ගැබිනි මව්වරුන්,කුඩා දරුවන් වැසි වෙලාවට

ඉන් බේරීම සඳහා කඩපිලට දුවන බව පැවසූ ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමා ඕලුගංතොට බලන්ගොඩ පැත්තට එන මගින්ට බස් නැවතුම්පොළක් සෑදීම ඉතා වැදගත් කටයුත්තක් බැවින් ඒ සඳහා සභාවේ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටින ලදී.

07෴06෴09 අඹසෙවන අසළින් ඇති නාන තොටුපල අසළ පඩිපෙළ ඉදිකර ප්‍රතිසංස්කරණය කිරීම

07෴06෴10 ඕලුගංතොට පෙට්ටි සාප්පුව ඉදිරිපිට නාන තොටුපළ ප්‍රතිසංස්කරණය කිරීම

ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා දෙක ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.මෙහිදී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමා

අඹසෙවන අසළින් ඇති නාන තොටුපල අසළ පඩිපෙළ ඉදිකර ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසත් ඕලුගංතොට පෙට්ටි සාප්පුව ඉදිරිපිට නාන තොටුපළ ප්‍රතිසංස්කරණය කිරීමෙන් නගර සභාවට ආදායමක් ගත හැකි බවත් මෙම නාන තොටුපළවල් අසළ වල් බිහිවී විනාශ වී ඇති බවත් කිසිදු මහජන නියෝජිතයෙක් ඒ පිළිබද අවධානය යොමු කර නැති බවත් පවසා සිටින ලදී.

07෴06෴11 වෙට්නෝල් පාරේ අමිත මහතාගේ නිවස අසළ සිට පහළ බෝක්කුව දක්වා කාණු පද්ධතියේ ඇති වැලි ඉවත් කර බෝක්කුව අසල පාරේ තාරදමා නිම කිරීම

ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

07෴06෴12 සුදර්ශන ගම සුදත් නිශාන්ත මහතාගේ නිවස අසළ සිට නාන ළිඳ දක්වා කාණු පද්ධතිය සකස් කිරීම

ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා වැසි වෙලාවට ගමන් කල නොහැකි තත්වයක් උදාවී ඇති බැවින් මෙම කාණු පද්ධතින් දෙකේ අවශ්‍ය සංවර්ධන කටයුතුද හැකි ඉක්මනින් ඉටුකර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

මෙහිදී අදහස් ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ඕලුගංතොට සුසාන භූමි ශාලාව තීන්ත ගෑම 2015 වර්ෂයේදී සිදු කල බවත්,රයිවත්ත පැති බැම්ම ඒ අසල පුද්ගලයෙක් විසින් ඉවුර කැපීම නිසා බාදනයට ලක් වී ඇති බවත්,ඕලුගංතොට පෙට්ටි සාප්පුව ඉදිරිපිට නාන තොටුපළට යන පියගැට පෙළ දෙපස වල් බිහිවීම නතර කිරීම සඳහා එවකට සතියකයට වරක් ශුද්ධ පවිත්‍ර කල බවත් ඒ සදහා නිරන්තරයෙන් නඩත්තු කල යුතු බවත් ගරු සභාවට පෙන්වා දෙන

ලදී. ගරු සභාපතිතුමන් මෙම පෙන්වා දුන් කරුණු පිළිබඳව ඉදිරියේදී සුදුසු කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බව පැවසූ අතර සභාවේ ඒකමතිකව සම්මත විය.

***07:07 ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා***

07:07:01 ෆලීල් හාජියාර් මාවත නගර සභා සීමාව තුළ පාරවල ඇති වලවල් පිරවීම.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

07:07:02 ෆලීල් හාජියාර් මාවත අඩි 20ක් පමණ දුර කැඩී යන පාර ආරක්ෂා වන පරිදි පිළිසකර කිරීම හා මාර්ගය ශුද්ධ පවිත්‍ර කිරීම.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා **විසින් ඉදිරිපත් කරන ලද** *ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි* පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර *මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.*

*මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා මෙම යෝජනා දෙක සඳහා ලොකු වියදමක් දැරීමට සිදු නොවන බවත්,ෆලීල් හාජියාර්* මාවත නගර සභා සීමාව තුළ පාරවල ඇති වලවල් පිරවීම *සභාවේ ජේ සී බී යන්ත්‍රය යොදා සිදු කල හැකි බවත් නගර සභාව මගින් ඇස්තමේන්තු සකස් කිරීමේදි මෙම මාර්ගවල කොටසක් සඳහා පමණක් ඇස්තමේන්තු සකස් කරන බවත් එසේ නොකර සම්පූර්ණ මාර්ගය කෙරෙහිම අවධානය යොමු කරන ලෙසත් තණකොල කපන මැෂින් යන්ත්‍රය යොදා මාර්ග ශුද්ධ පවිත්‍ර කර දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.*

*මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා මේ දිනවල පවතින වර්ෂාව අඩු වූ විගස මෙම කටයුතු සිදුකර දීමට අපේක්ෂා කරන බව පවසා සිටින ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.*

***07:08 ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය***

07:08:01 සුදර්ශනගම පදිංචි සිසිර ආනන්දගොඩ මහතාගේ නිවසේ සිට සුදත් නිශාන්ත මහතාගේ නිවස දක්වා කාණු පද්ධතියක් ලබාදීම

07:08:02 ආනන්ද මෛත්‍රිය මාවත ජල කාණුව සඳහා කොන්ක්‍රීට් ස්ලැබ් යෙදීම

07:08:03 ආනන්ද මෛත්‍රිය මාවත හා සුදර්ශනගම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දීම

*මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.*

*මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය දිගින් දිගටම ගරු සභාව වෙත යෝජනා ඉදිරිපත් කලද ඒවා ඉටුවෙන බවක් දක්නට නොලැබෙන බවත් පෙර සභාවල ඉල්ලීම් කල තලාද ප්‍රවාහනය තවමත් සිදු නොවූ බවත් පැවසූ අතර සුදර්ශනගම පදිංචි සිසිර ආනන්දගොඩ මහතාගේ නිවසේ සිට සුදත් නිශාන්ත මහතාගේ නිවස දක්වා කාණු පද්ධතියක් නොමැති බවත්,කළු ගල් තට්ටු මතින් වතුර*

ගලා නොබසින බැවින් මෑතකදී ඩෙංගු අවධානමකට මුහුන පෑමට සිදුවූ බවත් එබැවින් මෙම කාණුව නිසියාකාරව ලබාදීමට කඩිනමින් කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී. එමෙන්ම ආනන්ද මෛත්‍රීය මාවත ජල කාණුව සඳහා කොන්ක්‍රීට් ස්ලැබ් යෙදීම මෙන්ම සුදර්ශන ගමට යන මාර්ගය කැඩී ඇති බැවින් කසල ට්‍රැක්ටරය පවා කසල ගැනීමට එම මාර්ගයේ නොඑන බවත් ,පාරේ ඇති විශාල වළවල් නිසා වාහන ගමන් කිරීම අසීරු වී ඇති බවත් මින් එහි බදු ගෙවන ජනතාවට අසාධාරණයක් වන බවත් පැවසූ ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය ආනන්ද මෛත්‍රීය මාවත හා සුදර්ශනගම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දීම සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා තලාද ප්‍රවාහනය පිළිබඳ සොයා බලා පිලියමක් සලසා දෙන බවත් අනෙකුත් කරුණු පිලිබද ඉදිරියේදි කටයුතු කිරීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

***07:09 ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය***

07:09:01 කරව්කැටිය කාණු පද්ධතිය සකස් කිරීම.

ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය විසින් ඉහතින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

07:09:02 මහමෙව්නා භාවනා මධ්‍යස්ථානය පාර කාණු පිළිසකර දීම.

ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ඉහතින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

07:09:03 උඩකන්ද පාර කාණු පස් ගොඩවල් ඉවත්කර දීම හා කාණු බැමි සකස්කර දීම.

ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ඉහතින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

07:09:04 ගල්වල පාර කාණු සකස්කර දීම

ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ඉහතින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

07:09:05 බළන්ගොඩ කොට්ඨාශයේ උඩකන්ද ගමේ ඇති දමිළ ජනතාව වෙසෙන ගෙවල් 10 ක් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම.

ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ඉහතින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය ඉහතින් ඉදිරිපත් කරන ලද පළමු යෝජනා තුන පසුගිය සභා වාරයේදි සාකච්ඡා කල බවත් ගල්වල පාර කාණු සකස්කර දීම පිළිබඳ සභාවේ කඩිනම් අවධානය යොමුකරන ලෙස මෙහිදී ඉල්ලා සිටින ලදී. තව දුරටත් අදහස් දක්වමින් උඩකන්ද ගමේ අහිංසක දමිළ පිරිසක් ජීවත්වන බවත්, කාර්මික නිළධාරි මහතාගේ අධීක්ෂණය ලබාගෙන ඔවුනට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙසත්, මුදල්මය ආධාරමය නොව එම නිවෙස් සකස් කර ගැනිම සඳහා ද්‍රව්‍යමය ආධාර ලබාදී හෝ එම අසරණ ජනතාවට අවැසි පිහිට වීම කෙරෙහි සභාවේ අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ පිළිබදව ඉදිරියේදි ඉදිරියේදි කටයුතු කිරීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

### *07:10 ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා*

07:10:01 තුඹගොඩ වසමේ ඉහළ සඳුන්ගම කොටසට ජල සම්පාදනය මගින් පානීය ජලය ලබාදීමට එළා ඇති බට තවත් මීටර් 300 ක් පමණ දීර්ඝ කිරීම.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා මේවන විට සභාවාර බොහොමයක් නියෝජනය කර ඇති අතර ආණ්ඩු පක්ෂයේ නියෝජිතයන්ගේ යෝජනා පවා ක්‍රියාත්මක නොවන නිසා තම පක්ෂයෙන් ඉදිරිපත් කල යෝජනා පිළිබඳ සිතා බැලිය යුතු තත්වයක් උදා වී ඇති බවත්, ඕළුගංතොට ප්‍රදේශය පිළිබඳ කථා කිරිමේදි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා පැවසූ 'කොයි ජනතා නියෝජිතයෙක්ද මන්ද හිටියා. වැඩක් කෙරි නෑ' යන ප්‍රකාශයට විරෝධතාවය ප්‍රකාශ කරන බවත් , පෙර සභාවලදී සිදු කල සංවර්ධන කටයුතු පිලිබඳ ආඩම්බර විය හැකි බවත්, එම වකවානුවේ විපක්ෂය නියෝජනය කල මන්ත්‍රිවරුන්ටද මුදල් ප්‍රතිපාදන ලබාදුන් බවත් මෙහීදී පවසා සිටින ලදී. එමෙන්ම මැතිවරණ සමයේ ජනතාවට නොයෙක් මැතිවරණ පොරොන්දු දුන් මන්ත්‍රිවරු සිටින බවත්, ඒවා ඉටුකිරීම සඳහා සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක විය යුතු බවත් ,මන්ත්‍රි දීමනාව ලබාගැනීම වෙනුවෙන් හෝ ජනතාවට විය යුතු සේවය ඉටුකිරීම සඳහා කොට්ඨාශයට වෙන්වූ මුදල් මිලියනය අදාළ මන්ත්‍රිවරයාට ලබා දෙන මෙන් ඉල්ලා සිටි අතර කිවුළවෙල ගමේ සිදුවන ව්‍යවසනය පිළිබද සභාවේ අවධානය යොමු කර සොයා බලන ලෙස ඉල්ලා සිටින ලදී.

මේ සඳහා පිළිතුරු සැපයූ ගරු සභාපතිතුමා ගමින් ගම සංවර්ධනය කරගෙන යාමේ වැඩසටහනක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින බවත්, එහිදී මිනිසුන්ට සංවේදි වූ සංවර්ධන ගැටළු තෝරා ගෙන, අනෙකුත් රාජ්‍ය ආයතනවල සහයෝගය ලබාගෙන කොට්ඨාශයේ සංවර්ධනය සඳහා කොට්ඨාශයට වෙන්වූ මුදල් යොදවන බවත්, සභාව ආරම්භ කර තවමත් මාස 3ක් පමණ කාලයක් බැවින් සියළු යෝජනා ක්ෂණිකව ක්‍රියාවට නැංවීම අපහසු බවත් , තම පෞද්ගලික යෝජනා දෙක තුනක් හැරෙන්නට තමන් විසින් ඉදිරිපත් කල අනෙකුත් යෝජනා සභාව දෛනිකව පවත්වා ගෙන යාමට ඉදිරිපත් කල යෝජනා බවත් පවසා සිටින ලදී.එමෙන්ම සභාවට යෝජනා ඉදිරිපත් කිරීමේදී සෑම අවශ්‍යතාවයක්ම යෝජනා ලෙස ලයිස්තු වශයෙන් ඉදිරිපත් නොකර ප්‍රමුඛතාගත ක්‍රම වේදයකට ඉදිරිපත් කිරීම පිළිබඳ සැළකිලිමත් වන ලෙසද ගරු සභාපතිතුමා මෙහිදී ඉල්ලා සිටින ලද අතර ඉහත ඉදිරිපත් කරන ලද යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.

### *07:11 ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය*

07:11:01 කිරිඳිගල බදුල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ සමෘද්ධි බැංකු සංගමය අසළ හා ඩයමන්ඩ් උත්සව ශාලාව ඉදිරිපිට මගී ආවරණ 02ක් ඉදිකිරීමට අනුමැතිය ලබාගැනීම.

07:11:02 වීථි ලාම්පු සවිකර නොමැති ස්ථාන සඳහා අලුතින් වීථි ලාම්පු සවි කිරීම

ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා දෙක ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

07:11:03 බළන්ගොඩ නගර සභාව මගින් අයකරගනු ලබන 55% ක ජල නළ එළීමේ ගාස්තුව ඉවත් කරගැනීම

ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

07:11:04 බළන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පලේ පුද්ගලික බස්රථ සේවක මහතුන්ගේ වැසිකිළි ගාස්තුව අය නොකිරීම හෝ ඔවුනට පෙර තිබූ වැසිකිළිය නැවත ලබාදීම

ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

07:11:05 වැලිහරනාව මැද මාර්ගයේ තාවකාලිකව කැඩී ගිය ස්ථාන වල තාර යොදා වාහන ගමනාගමනයට සුදුසු පරිදි සංවර්ධනය කිරීම

ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

07:11:06 ජූනි 27 පොසොන් පොහොය නිමිත්තෙන් පැවැත්වීමට නියමිත බත් දන්සල සඳහා පොදු වෙළඳසැලෙහි තීන්ත ආලේපකර ගේට්ටුව අලුත්වැඩියා කර දීම විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් මෙහි දක්වා ඇති යෝජනා අතරින් තුන්වෙනි යෝජනාව පිළිබඳ කථා කිරිමට අවශ්‍ය බවත් ශෛලතලාරාම පන්සල වෙත ජලය ලබාගැනීම සඳහා ජල සම්පාදන මණ්ඩලය මගින් කන්ද හරහා වතුර ගැනීමට සැලසුම් කර ඇති බවත් එහිදී මන්ත්‍රි ප්‍රතිපාදන රු 400,000.00 ක මුදලින් රු.220,000.00 පමණ මුදලක් එනම් 55 % පමණ ප්‍රමාණයක් මාර්ගය පළුදු කිරීමේ ගාස්තු ලෙස සභාවට ගෙවීමට සිදු වීම නිසා අදාළ කාර්යය කරගැනීමට නොහැකි බැවින් එම ගාස්තු නිදහස් කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

මෙහිදී පූජනීය ස්ථානයකට ජල ලබා ගැනීමේ සත් ක්‍රියාවක් බැවින් ඒ පිළිබඳ සලකා පළුදු කිරීමේ ගාස්තු සභාවෙන් දරා එම ගාස්තු නිදහස් කිරීම සුදුසු බව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා යෝජනා කර සිටින ලදී.මෙහිදී ගරු සභාවේ පළවූ බහුතර සභික අදහස් සැළකිල්ලට ගෙන යෝජනාව ස්ථිර කරමින් මෙම පූජනීය ස්ථානය කරා ජල නළ එළීමේදි අයකරනු ලබන මාර්ගය පළුදු කිරීමේ ගාස්තුව නිදහස් කිරීමටත් ජල නල එළීමෙන් පසු මාර්ගය යථා තත්වයට පත්කරගැනීම පිළිබඳ වගකීම අදාළ මන්ත්‍රිවරිය භාර ගෙන ක්‍රියා කරන ලෙසත් මෙහිදී ගරු සභාපතිතුමා පවසා සිටින ලදී.

බළන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පලේ පුද්ගලික බස්රථ සේවක මහතුන්ගේ වැසිකිළි ගාස්තුව අය නොකිරීම හෝ ඔවුනට පෙර තිබූ වැසිකිළිය නැවත ලබාදීම පිළිබඳව ගරු සභාවේ අවධානය යොමුකරන ලෙසත් වැසිකිලියෙන් ලැබෙන ආදායම සැලකීමේදි ටෙන්ඩර් කිරීමට වඩා සේවකයෙකු යොදවා නඩත්තු කිරීමෙන් සභාවට වැඩි ආදායමක් ලැබෙන බව පෙනීයන බව ගරු මන්ත්‍රිතුමිය වැඩිදුරටත් මෙහිදී ප්‍රකාශ කරන ලදී.එමෙන්ම වැලිහරනාව මැද මාර්ගයේ තාවකාලිකව කැඩී ගිය ස්ථාන වල තාර යොදා වාහන ගමනාගමනයට සුදුසු පරිදි සංවර්ධනය කිරීම පිළිබඳවද ගරු සභාවේ අවධානය යොමු කරන මෙන් ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ඉල්ලා සිටින ලදී.

බළන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පලේ පුද්ගලික බස්රථ සේවක මහතුන්ගේ වැසිකිළිය නැවත ලබාදීම පිළිබඳව සොයා බලා කටයුතු කරන බව ගරු සභාපතිතුමා මෙහිදී පවසා සිටින ලදී.
ඒ අනුව ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා යටතේදී පූජනීය ස්ථානයක් බැවින්

ශෛලතලාරාම පන්සල වෙත ජලය ලබාගැනීම සඳහා පමණක් මාර්ග පළුදු කිරීමේ ගාස්තු නිදහස් කිරීමට හා අනෙකුත් යෝජනා සම්බන්ධයෙන් සුදුසු පරිදි ඉදිරියේදී කටයුතු කිරීමට සභාවේ ඒකමතිකව සම්මත විය.

*07:12 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා*

07:12:01 ඕලුගංතොට මූලික රෝහලේ පිවිසුම් මාර්ගය අබලන් තත්ත්වයේ පවතින බැවින් කඩිනමින් පිළිසකර කිරීම.

07:12:02 බදුලු කොළඹ ප්‍රධාන මාර්ගය හා සම්බන්ධ වන කරදියමුල්ල හා රයිවත්ත මාර්ගය හන්දිය අසල වීථි කණ්ණාඩියක් සවිකිරීම.

07:12:03 ඕලුගංතොට ගොවි සංවිධානය වෙත වායු රයිපලයක් ලබාදීම.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා තුන ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ඕලුගංතොට මූලික රෝහලේ පිවිසුම් මාර්ගය ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් ගිලන් රථයකට යෑමට පවා ඉතා අපහසු තත්වයකට පත්ව ඇති බවත්,ප්‍රිමික්ස් යොදා මෙය පිළිසකර කර දෙන ලෙසත් ඉල්ලා සිටි අතර, බදුලු කොළඹ ප්‍රධාන මාර්ගය හා සම්බන්ධ වන කරදියමුල්ල හා රයිවත්ත මාර්ගය හන්දිය අසල අනතුරු බහුල ස්ථානයක් බැවින් රයිවත්ත මාර්ගය පෙනෙන පරිදි අධ්‍යාපන කාර්යාලයට පිවිසුම් මාර්ගය ඉදිරිපිට වීථි කණ්ණාඩියක් සවිකර දෙන ලෙසත් ඕලුගංතොට ගොවි සංවිධානයේ බලවත් ඉල්ලීම පරිදි රිලවුන් ගහණය බහුල නිසා වායු රයිෆලයක් ලබා දෙන ලෙසත් මෙහිදී ඉල්ලා සිටින ලදී.

ඕලුගංතොට මූලික රෝහලේ පිවිසුම් මාර්ගය අබලන් තත්වය සඳහා පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා සම්බන්ධකරණ කමිටුවේදි මේ පිළිබඳ සාකච්ඡා කල බවත් ඒ අනුව ඉදිරියේදී එම කටයුතු සිදුවෙන බවත්, බදුලු කොළඹ ප්‍රධාන මාර්ගය හා සම්බන්ධ වන කරදියමුල්ල හා රයිවත්ත මාර්ගය හන්දිය අසල වීථි කණ්ණාඩියක් සවිකිරීම පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියෙන් උපදෙස් ලබාගෙන ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරන බවත්, ඕලුගංතොට ගොවි සංවිධානය වෙත වායු රයිපලයක් ලබාදීම සම්බන්ධව ගොවි සංවිධානය හරහා ඉල්ලීමක් සිදු කරන ලෙසත්,ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දැනුවත් කර අවශ්‍ය කටයුතු සිදුකරන බවටත් පවසා සිටින ලදුව එම යෝජනා සභාවේ ඒකමතිකව සම්මත විය.

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2018.05.22 දින පැවති මුදල් හා කර්මාන්ත කමිටු වාර්තාව ගරු සභාවට ඉදිරිපත් කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | **8,160,652.10** |
| වෙනත් ලැබීම් | **1,262.761.00** |
| මුලු ලැබීම් | **9,423,413.10** |
| පුනරාවර්ථන වියදම් | **6,515,441.80** |
| වෙනත් වියදම් | **948,775.69** |
| මුලු වියදම් | **7,464,217.49** |

ඉන්ධන වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.

2018 -04-01 සිට 2018-04-31 දක්වා

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 226-7521 | 6,165.00 |
| 226-7521 | 920.00 |
| 227-5020 | 29,430.00 |
| 37-7933 | 11,384.50 |
| 56-1906 | 9,025.00 |
| BC-0005 | 19,000.00 |
| FCON0015 | 950.00 |
| FP 0002 | 220.00 |
| GC 0001 | 10,530.00 |
| GC 0001 | 1,760.00 |
| GC 0001 | 770.00 |
| GK-6227 | 28,470.00 |
| LL-2110 | 6,257.00 |
| LL-7688 | 5,700.00 |
| ND-5124 | 18,525.00 |
| OV/M0017 | 3,938.00 |
| PF-4006 | 24,225.00 |
| QL-2901 | 4,680.00 |
| RB-4786 | 16,150.00 |
| RC-1118 | 29,430.00 |
| RC-8183 | 13,110.00 |
| RD-8240 | 31,260.00 |
| RD-8240 | 700.00 |
| SDRR0013 | 475.00 |
| RE-2600 | 37,515.00 |
| UQ-1933 | 1,170.00 |
| VI-1833 | 1,170.00 |

| | |
|---|---|
| ZA-5039 | 49,550.00 |
| එකතුව | **362,479.50** |

2018 -05-01 සිට 2018-05-31 දක්වා

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 226-7521 | **11,400.00** |
| 227-5020 | **40,830.00** |
| 37-7933 | **13,518.50** |
| 56-1906 | **17,575.00** |
| BC-0005 | **28,500.00** |
| FCON0015 | **1,425.00** |
| FP 0002 | **2,640.00** |
| GC 0001 | **12,870.00** |
| GC 0001 | **930.00** |
| GC 0001 | **2,200.00** |
| GC 0001 | **1,155.00** |
| GK-6227 | **35,110.00** |
| HF-7899 | **3,850.00** |
| LL-2110 | **6,037.00** |
| LL-7688 | **10,450.00** |
| MIXB0011 | **1,170.00** |
| ND-5124 | **13,775.00** |
| OV/M0017 | **3,850.00** |
| PF-4006 | **30,400.00** |
| QL-2901 | **5,616.00** |
| RB-4786 | **22,760.00** |
| RB-4786 | **1,400.00** |
| RC-1118 | **40,810.00** |
| RC-8183 | **4,750.00** |
| RD-8240 | **39,820.00** |
| RE-2600 | **46,540.00** |
| UQ-1933 | **2,572.50** |
| ZA-5039 | **38,465.00** |
| එකතුව | **440,419.00** |

10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්

**<u>ගරු නගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා</u>**

මෙවර සභාවට යෝජනා ඉදිරිපත් නොකල අතර ළමා උයන අභාවයට යාම පිළිබඳ කථා කල යුතුම බවත්, උදේ සිට සවස දක්වා බියර් පානය කරන පුද්ගලයින් ඒ අසළ ගැවසීම දක්නට ඇති බැවින් ඒ සඳහා අවධානය යොමු කල යුතු බවත්, දුරකථන දීමනාව ගෙවීමේදී පෙර ගෙවුම් දුරකථන බිල්පත් ගෙවීම සඳහා ක්‍රමවේදයක් තිබේද යන්නත් මෙහිදී විමසා සිටින ලදී. කරව්කැටිය පාර සංවර්ධනය ඉතිරි කටයුතු කරදෙන ලෙසත්,තුරු උයන ගඟ දිගේ සුද්ධ කිරීම ,කාර්පාක් කඩ කාමර ඉදිරිපිට පිලිසකර කිරීම, ක්‍රීඩාංගනය හා පොදු වෙළෙඳ සැල පිටුපස ශුද්ධ පවිත්‍ර කිරීම පිළිබඳ ගරු සභාවේ අවධානය යොමු කරන මෙන් මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා</u>**

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමන් විසින් නිල බලයෙන් සාම විනිසුරු වරයෙකු වූ විට දිවුරුම් දීම සභාව හරහා සිදුවෙනවාද යන්න විමසා සිටි අතර ඒ පිළිබඳ කටයුතු සොයාබලන මෙන් ඉල්ලා සිටින ලදී. එමෙන්ම සභාපති අරමුදල පිළිබඳ දැනුවත් කිරීමක් සිදුකරන මෙන් ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රීතුමන් හට ගරු සභාපතිතුමා විසින් කරුණු පැහැදිලි කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් අදහස් දක්වමින් කරව්කැටිය හා ගල්වල මාර්ග දෙකහි අලුතින් ඉදි කෙරෙන නිවාස මාර්ගයට අවශ්‍ය ඉඩකඩ නොතබා ඉදි කිරීම පිළිබඳ ගරු සභාවේ අවධානය යොමු කරන මෙන් ප්‍රකාශ කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය</u>**

ගරු සභාව වෙත අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ගරු සභාව නියෝජනය කරන කාන්තා මන්ත්‍රීතුමියන් වෙනුවෙන් දුරකථන පහසුකම් හා සහනදායි ක්‍රමවේදයකට යතුරුපැදි ලබාදෙන මෙන් ඉල්ලා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා</u>**

අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් 2011 සිට 2015 දක්වා සභා කාලය තුළ එවකට උප සභාපති වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අවශ්‍ය සහයෝගය ලබාදුන් බවත් එම නිසා ඔවුනට සහයෝගය ලබා දෙමින් සියලු දෙනා එක්ව මෙම සභාවේ වැඩකටයුතු සිදුකරගෙන යාමට කටයුතු කළ යුතු බවත් හුණුකුඹුර නිමල් මහතාගේ ගැටලුව පිළිබඳවත්, ප්‍රධාන මුස්ලිම් පල්ලියට ගලි බවුසරය නොමිලේ ලබාදීම සම්බන්ධවත්, තරංගනී මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කළ ශෛලතලාරාම පන්සලේ මාර්ගය පළුදු කිරීමේ ගාස්තු නිදහස් කිරීම සම්බන්ධවත් ගරු සභාවේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා</u>**

ගරු සභාවට අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් නැවත සභාවට යෝජනා ඉදිරිපත් කිරීමට අපේක්ෂාවක් නොමැති අතර ඉදිරිපත් කරන ලද යෝජනා ඉටු කර දීම කෙරෙහි අවධානය යොමු කරන ලෙසත්, ප්‍රාර්ථනා බෝධිය අසල කසළ වෙන්කිරීමේ බඳුන් ලබාදීම පිළිබඳ කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත් ඉල්ලා සිටින ලදි.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා</u>**

පෙර සභාවලදී තමන් විසින් ගන්නා ලද තද තීන්දු තීරණ නිසා සභාවේ වැඩ කටයුතු සමබරව පවත්වාගෙන යාමට හැකියාවක් ලැබුණ බවත් පක්ෂ විපක්ෂ බේදයක් නොමැතිව එකළ සහයෝගයෙන් යුතුව වැඩකටයුතු සිදුකළ බවත් එවන් සහයෝගයක් මෙවර ද අපේක්ෂා කරන බවත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් පවසා සිටින ලදි.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා</u>**

මන්ත්‍රීවරු හා කාර්ය මණ්ඩලය එක තැනකට ගෙනෙන සංගමයක් ලෙස යහසාධක සංගමය නිර්මාණය කල බවත් ඒ සඳහා මෙවරද සභාවේ මන්ත්‍රීවරුන්ගේ දායක කර ගන්නා ලෙස ඉල්ලා සිටි අතර නගරයේ හදවත බදු ව්‍යාපාරිකයන් රැක ගැනීම සඳහා තක්සේරුව 2018 ජූනි මස සිට ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන පාලන කොමසාරිස් කාර්යාලය විසින් ගත් තීරණය ඉතා අගය කළ යුතු බවත් ඒ සඳහා ගරු සභාවේ මහත් ප්‍රසාදය ඔවුන් වෙත පළ කරන බවත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් ප්‍රකාශ කර සිටින ලදි. එමෙන්ම නිවාස ආධාර ලබාදීම වැනි මන්ත්‍රීවරුන්ගේ සිතට දැනෙන සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරන ලෙසත් ක්‍රීඩා පිටියේ සංවර්ධනය මුදල් ප්‍රතිපාදන සපයා ගන්නා ලෙසත් ටෙන්ඩර් කටයුතු සිදු කිරීමේදී ගරු සභාවේ යෝජනා අදහස් ලබාගැනීමට කාරුණික වන ලෙසත්, ඡන්ද 10 ක් හිමි සභාවේ විපක්ෂය පිළිබඳ සුලු කොට නොතකන ලෙසත්, අවුරුදු 14 ක් තුළ නගරයට කළ සේවාව පිළිබඳ තමා තෘප්තිමත් වන බවත් සම්බන්ධීකරණ රැස්වීමට යාමට සහාය දැක්වූ ගරු සභාපති තුමාට ස්තූතිවන්ත වන බවත් මෙහිදී පවසා සිටින ලදි.

**<u>ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා</u>**

සම්බන්ධීකරණ කමිටුව යාමට සහාය දැක්වූ ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වනබව පවසා සිටි ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා සභාවේ සැමොටම පොදුවේ එක් අයුරකින් සාධාරණයක් සිදු වේ යැයි අපේක්ෂා කරන බවත්,මන්ත්‍රී ප්‍රතිපාදන ලක්ෂ 4ට අමතරව එම කොට්ඨාශයට ලැබෙන ලක්ෂ 6ක මුදල කොට්ඨාශයේ සංවර්ධනය සඳහා යෙදවිය හැකි බවත්,බලංගොඩ නගර සභාවේ සංවර්ධනය උදෙසා ජනතාව සමග එකතුවෙමුයි පවසමින් කරුණු දැක්වීම නිමා කරන ලදී.

**11. අවසානය**

මෙහිදී ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් සභාවේ සියළුම දෙනා බොහෝ ගෞරවාන්විතව හැසිරෙමින් සභාවේ කටයුතු හොඳින් කර ගෙන යාමට දැක්වූ සහයෝගය පිළිබඳව ස්තූතිවන්ත වන බව පවසා සිටි අතර, හිත් රිදීමක් හෝ අඩුපාඩුවක් සිදු වූවා නම් ඒ වෙනුවෙන් කනගාටු වන බවත්,නගරයේ සංවර්ධනය උදෙසා කටයුතු කිරීම පරමාර්ථය කොට ගෙන ක්‍රියාකිරීම සඳහා කැප වෙමුයි පවසමින් ගරු සභාවේ කටයුතු ප.ව. 5.30 ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,

සභාපති,

බලංගොඩ නගර සභාව.